ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
***

# පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියානු සන්නද්ධ හමුදා නියෝජිත පිරිසක් බටලන්ද ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ...</u>

වෙලින්ටන් හි ආරක්ෂක සේවා මාණ්ඩලික විද්‍යාලයේ සහ පූනේ හි තාක්ෂණය පිළිබඳ හමුදා ආයතනයේ සන්නද්ධ හමුදා උපදේශකවරුන්ගෙන් සමන්විත සිවි සාමාජික නියෝජිත පිරිසක් 2022 නොවැම්බර් 07-12 දිනවල ශ්‍රී ලංකා සංචාරයක නිරත විය. එම නියෝජිත පිරිස බටලන්ද, ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා හදාරන ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා නිලධාරීන් සඳහා නවීනතම හමුදා තාක්ෂණය සහ වර්තමාන සහ අනාගත යුධමය කටයුතු සඳහා එහි භාවිතය පිළිබඳ පුහුණු කැප්සියුලයක් පැවැත්වීය. නිරවද්‍ය ඉලක්කයන්ට අවි ආයුධ භාවිතය, සයිබර් කටයුතු, අභ්‍යවකාශ කටයුතු, තොරතුරු තාක්ෂණය, කෘත්‍රිම බුද්ධිය සහ රොබෝ තාක්ෂණය ඇතුළු නවීන යුධ කටයුතු හා සම්බන්ධ අලුත්ම තාක්ෂණයන් මෙම පාඨමාලාවෙන් ආවරණය කරන ලදී. නියෝජිත පිරිස මෙම සංචාරය අතරතුර ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිතුමා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මාණ්ඩලික ප්‍රධානිතුමා, ශ්‍රී ලංකා යුධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානිතුමා සහ ජාතික ආරක්ෂක විද්‍යාලයේ අණදෙන නිලධාරීතුමා ද හමු විය.

2. අත්දැකීම් බෙදා හදා ගැනීම සහ පුහුණුවීම් ඉන්දු - ශ්‍රී ලංකා ආරක්ෂක සහයෝගීතාවයේ වැදගත් කුළුණක් වේ. ආරක්ෂක ක්ෂේත්‍රයේ සූදානම්භාවය ඉහළ නැංවීම සඳහා මනා සහෝදරත්වයක් සහ කාර්ය සහයෝගීතාවයක් දෙරට ආරක්ෂක හමුදා අතර දැකිය හැකිය. ඉන්දීය සහ ශ්‍රී ලංකා හමුදාවන් අතිශය වැදගත් ද්විපාර්ශවික පුහුණුවීම් ද සිදු කරන අතර ඉන්දියාවේ ආරක්ෂක සේනා පුහුණු ආයතන වාර්ෂිකව ශ්‍රී

ලංකාවට පුහුණු අවස්ථාවන් 1500ක් (යුධ හමුදාව සඳහා - 900ක්, නාවික හමුදාව සඳහා - 350ක්, ගුවන් හමුදාව සඳහා - 250ක්) පමණ ලබා දේ. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා ඉන්දියාව දක්වන දැඩි කැපවීම සහ මෙවැනි වැඩසටහන් ඉන්දියාවේ "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තිය පිළිඹිබු කරන අතර කලාපීය සාමය, ආරක්ෂාව සහ ස්ථාවරත්වයට දයකත්වය ලබා දෙමින් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා අතර පවතින සුහද සබඳතා පෝෂණය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.

***

කොළඹ
2022 නොවැම්බර් 11